**හපුතලේ ප්‍රාදේශීය සභාව**

**බදුල්ල දිස්ත්‍රික්කය**

-------------------------------

## 1. මූල්‍ය ප්‍රකාශන

## 1.1 මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කිරීම

2016 සඳහා වූ මූල්‍ය ප්‍රකාශන 2017 මාර්තු 30 දිනදීද, ඉකුත් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන 2016 මාර්තු 28 දිනද විගණනයට ඉදිරිපත් කරන ලදී. 2016 වර්ෂය සඳහා වූ විගණකාධිපතිවරයාගේ වාර්තාව 2017 ජුනි 30 දින ලේකම්වරයා වෙත නිකුත් කරන ලදී.

## 1.2 තත්ත්වාගණනය කළ මතය

මෙම වාර්තාවේ 1.3 ඡේදයේ දක්වා ඇති කරුණුවලින් වන බලපෑම හැර, මූල්‍ය ප්‍රකාශනවලින් 2016 දෙසැම්බර් 31 දිනට හපුතලේ ප්‍රාදේශීය සභාවේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරිත්වය පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

## 1.3 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම

### 1.3.1 ගිණුම්කරණ ප්‍රතිපත්ති

ප්‍රාදේශීය සභාව අවසාන තොග අගය කිරීමේ ප්‍රතිපත්තිය හෙළිදරව් කර නොතිබුණි.

### 1.3.2 ගිණුම්කරණ අඩුපාඩු

(අ) 2014 වර්ෂයේ මුද්දර ගාස්තු ආදායම රු. 463,854 ක් සමාලෝචිත වර්ෂයේ ආදායම ලෙස ගිණුම්ගත කර තිබුණි.

(ආ) සමාලෝචිත වර්ෂයේ මුද්දර ගාස්තු ආදායම රු.637,306 ක් අඩුවෙන් බිල්කිරීම් කර තිබුණි.

(ඇ) සමාලෝචිත වර්ෂයේ ලැබිය යුතු ගවමස් කඩකුලී ආදායම රු.205,405 ක් ගිණුම්ගත කර නොතිබුණි.

(ඈ) සමාලෝචිත වර්ෂයේ ලැබිය යුතු කඩකුලී ආදායම රු.25,824 ක් ගිණුම්ගත කර නොතිබුණි.

(ඉ) සමාලෝචිත වර්ෂයේ හිඟහිටි මුද්දර ගාස්තු රු. 32,980 ක් ගිණුම්ගත කර නොතිබුණි.

### 1.3.3 ලැබිය යුතු හා ගෙවිය යුතු ගිණුම්

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට ලැබිය යුතු ගිණුම් ශේෂවල වටිනාකම රු.12,713,526 ක් වූ අතර, ගෙවිය යුතු ගිණුම් ශේෂ වල වටිනාකම රු. 11,624,835 ක් විය.

### 1.3.4 විගණනය සඳහා සාක්ෂි නොවීම

අවශ්‍ය තොරතුරු විගණනයට ඉදිරිපත් නොකිරීම නිසා එකතුව රු. 75,829,579 ක වත්කම් විෂයක් විගණනයේ දී සතුටුදායක ලෙස සන්නිරීක්ෂණය කිරීමට නොහැකි විය.

1.3.5 **නීති, රීති හා රෙගුලාසිවලට අනුකූල නොවීම**

විගණනයේ දී නිරීක්ෂණය වූ නීති, රීති, රෙගුලාසි යනාදියට අනුකූල නොවූ අවස්ථා පහත දැක්වේ.

| නීති, රීති, රෙගුලාසි යනාදියට යොමුව | අනුකූල නොවීම් |
| --- | --- |
| (අ) 1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනත | |
| (i) 132 (ඒ) හා (ඔ) වගන්ති | අවස්ථා 07 කදී එකතුව රු.90,343 ක් වූ වියදම් සඳහා අමාත්‍යවරයාගේ අනුමැතිය ලබා ගෙන නොතිබුණි. |
| (ii) 134(1) වගන්තිය | නිශ්චල දේපලක් වර්ෂ 5 කට වරක් තක්සේරු කර වාර්ෂික වටිනාකම මත වරිපනම් බද්දක් අය කිරීම වෙනුවට 2002 වර්ෂයේ දී සිදුකරන ලද තක්සේරුවක් මත වරිපනම් බදු අයකර තිබුණි. |
| (ආ) 1988 ප්‍රාදේශීය සභා (මූල්‍ය හා පරිපාලන රීති සංග්‍රහයේ 177 රීතිය | කඩ කාමර 15 ක් ටෙන්ඩර් කැඳවීමකින් තොරව මාසික කුලී පදනම මත ලබාදී තිබුණි. |
| (ඇ) ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල් රෙගුලාසි | |
| (i) මු.රෙ. 396 (ඇ) | නිකුත් කළ නමුත් ගෙවීම සඳහා ඉදිරිපත් නොකල එකතුව රු.55,314 ක් වන චෙක්පත් 04 ක් කටයුතු කර නොතිබුණි. |
| (ii) මු.රෙ. 571 | වසර 02 ක කාලයක් ඉක්ම වූ අවස්ථා 181 කට අදාල රු.781,763 ක් වූ තැන්පත් නියාදනය කර නොතිබුණි. |
| (ඈ) ආයතන සංග්‍රහය xxiv වන 1:6 හා 4 වගන්ති | ස්ථාන මාරුවීම් ලැබූ හා සේවය හැරගිය පරිච්ඡේදයේ සේවකයින් 11 දෙනෙකුගෙන් හිඟ හිටි එකතුව රු.50,012 ක සේවක ණය අයකර නොතිබුණි. |
| (ඉ) පළාත් පාලන කොමසාරිස්ගේ 1980/46 හා 1980 දෙසැම්බර් 31 දිනැති චක්‍රලේඛය කඩ කාමර 62 ක් සඳහා | සියළුම වෙළඳපොල කඩ කාමරවල මාසික බදු අංක කුලිය වර්ෂ 5 කට වරක් තක්සේරු කරවා ගත යුතු වුවද, මාසික ආදායම රු.257,122 ක් වූ සභාව සතු විධිමත් තක්සේරුවක් සිදුකර නොතිබුණි. |
| (ඊ) ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ අංක 2361 හා 2015 දෙසැම්බර් 04 දිනැති ගැසට් පත්‍රය | සභා බල ප්‍රදේශය තුල පවත්වාගෙන යන දුරකථන සම්ප්‍රේෂණ කුළුණු 08 ක් සඳහා රු.24,000 ක ගාස්තු අයකර නොතිබූ අතර බලපත්‍ර ද ලබාගෙන නොතිබුණි. |

2. **මූල්‍ය සමාලෝචනය**

-----------------------

2.1 **මූල්‍ය ප්‍රතිඵල**

--------------

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව 2016 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා සභාවේ පුනරාවර්තන වියදම ඉක්මවූ ආදායම රු.2,598,636 ක් වූ අතර, ඊට අනුරූපීව ඉකුත් වර්ෂයේ පුනරාවර්තන වියදම ඉක්ම වූ ආදායම රු.13,341,259 ක් විය.

2.2 **ආදායම් පරිපාලනය**

-----------------------

2.2.1 **ආදායම් රැස්කිරීමේ කාර්ය සාධනය**

--------------------------------------

(අ) ඉකුත් වර්ෂයට අදාලව සමාලෝචිත වර්ෂයේ ප්‍රාදේශීය සභා අරමුදලට ලැබිය යුතු හිඟ හිටි ආදායම රු.1,288,078 ක් වූ අතර, සමාලෝචිත වර්ෂය සඳහා බිල් කළ ආදායමෙන් සියයට 50 ක් සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දින වන විටත් හිඟ හිටව තිබුණි.

(ආ) 2012 වර්ෂයෙන් පසුව පවතින ආදායම් වැඩිකර ගැනීමට ආදායම් මාර්ග තක්සේරු කර නොතිබුණි.

2.2.2 **උසාවි දඩ හා මුද්දර ගාස්තු**

-----------------------------

පළාත් සභාවේ ප්‍රධාන ලේකම්වරයාගෙන් හා අනෙකුත් බලධාරීන්ගෙන් 2016 දෙසැම්බර් 31 දිනට ලැබිය යුතුව තිබූ උසාවි දඩ සහ මුද්දර ගාස්තු රු.3,715,229 ක් විය.

3. **මෙහෙයුම් සමාලෝචනය**

----------------------------

3.1 **මෙහෙයුම් අකාර්යක්ෂමතා**

-------------------------------

ක්ෂේත්‍රවල ස්ථිර කම්කරුවන් 26 දෙනෙකු කාර්යාලීය කටයුතු සඳහා යොදවා ගෙන තිබීම හේතුවෙන් ක්ෂේත්‍රයේ අදාල රාජකාරි සඳහා අනියම් හා ආදේශක පදනම මත කම්කරුවන් 17 දෙනෙකුට 2016 වර්ෂය තුළ රු.2,775,199 ක් ගෙවා තිබුණි.

3.2 **නිෂ්කාර්ය වත්කම්**

--------------------

භාවිතයෙන් ඉවත් කරන ලද සභාවට අයත් රු.1,345,000 ට මිලදී ගත් වාහන 02 ක් අළුත්වැඩියා කිරීමට හෝ අපහරණය කිරීමට කටයුතු කර නොතිබුණි.

3.3 **හඳුනාගත් අලාභ**

-------------------

(අ) පළාත් නිශ්චිත සංවර්ධන ප්‍රදාන - පළාත් පාලන සේවා වැඩසටහන යටතේ හපුතලේ ප්‍රාදේශීය සභාව සඳහා ආදාහනාගාරයක් ඉදිකිරීම වෙනුවෙන් රු.2,952,705 ක් අත්තිකාරම් වශයෙන් කොන්ත්‍රාත්කරු වෙත ලබාදී තිබූ අතර ඌව පළාත් සභා අමාත්‍ය මණ්ඩල රැස්වීමේ දී ගත් තීරණයක් අනුව එම කර්මාන්තය අවලංගු කර තිබුණි. තවද කොන්ත්‍රාත්කරු කළ වැඩ වෙනුවෙන් රු.106,443 ක් ගෙවා තිබුණු අතර, එය ප්‍රතිපූරණය කරගෙන නොතිබුණි.

(ආ) මන්ත්‍රීවරුන්ගේ නිල කාලය අවසන් වුවද, සභාපති ඇතුළු මන්ත්‍රීවරු 11 දෙනෙකු සඳහා මැයි මාසයට සම්පූර්ණ සභික දීමනාවම ගෙවා තිබුණු නමුත්, වැඩිපුර ගෙවූ රු.81,000 ක් නැවත අයකර ගැනීමට සභාව කටයුතු කර නොතිබුණි.

4. **ගිණුම් කටයුතු භාවය හා යහපාලනය**

4.1 **අයවැය පාලනය**

සමාලෝචිත වර්ෂයේදී අයවැය ලේඛනය ආදායම් හා වියදම් පාලනයේදී පාලන උපකරණයක් ලෙස භාවිතා කර නොතිබුණි.

4.2 **වාර්ෂික ප්‍රසම්පාදන සැලැස්ම**

ප්‍රවර්තන වර්ෂයේ වාර්ෂික ප්‍රසම්පාදන සැලැස්මක් ක්‍රියාත්මක කර නොතිබුණි.

4.3 **අභ්‍යන්තර විගණනය**

2016 වර්ෂය සඳහා අභ්‍යන්තර විගණනයක් සිදුකර නොතිබුණි.

4.4 **විගණන හා කළමනාකරණ කමිටු ක්‍රියාත්මක කිරීම**

ප්‍රවර්තන වර්ෂයේ විගණන කළමනාකරණ කමිටු ක්‍රියාත්මක කර නොතිබුණි.

5. **පද්ධති හා පාලන**

පහත සඳහන් පද්ධති හා පාලන ක්ෂේත්‍ර කෙරෙහි සභාවේ විශේෂ අවධානය යොමු කරනු ලැබේ.

(අ) ස්ථාවර වත්කම්
(ආ) කොන්ත්‍රාත් පාලනය
(ඇ) අභ්‍යන්තර පාලනය
(ඈ) තොග පාලනය
(ඉ) ආදායම් පාලනය
(ඊ) වාහන පාලනය
(උ) වියදම් දැරීම
(ඌ) ගිණුම්කරණය